**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2017**

**-----------------------------------------------------------**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයෙහි අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

## 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-------------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2015, 2016 සහ 2017 වර්ෂයන්ට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම

**------------------------------------**

අධිකාරිය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2014 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | වටිනාකම |
|---|---|
| | රු. |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 16,752,897 |
| ජංගම වත්කම් | 2,492,381 |
| මුළු වත්කම් | 19,245,278 |

| | |
|---|---|
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 3,705,071 |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන බැරකම් | 13,840,972 |
| ජංගම බැරකම් | 1,699,235 |
| | ------------- |
| මුළු බැරකම් | 19,245,278 |
| | ======== |
| මුළු ආදායම | 30,592,712 |
| මුළු වියදම | 27,064,820 |
| | -------------- |
| අතිරික්තය | 3,527,892 |
| | ========= |

**2.3 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) <u>ව්‍යවස්ථාපිත විධිවිධාන</u> | |
| 2006 අංක 12 දරන මුද්දර බදු පනත හා 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු. 25 ක් වූ මුද්දර ගාස්තු අයකළ යුතු වුවත් රු.2,365,101 ක් වූ ආපදා ණය ගෙවීම් සම්බන්ධයෙන් නිලධාරීන් 11 දෙනෙකුගෙන් මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| (ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය</u> | |
| XXIV වැනි පරිච්ඡේදයේ | |
| (i) 3.5 වගන්තිය | ණය වාරිකය වෙනුවෙන් හා වෙනත් අඩුකිරීම් වෙනුවෙන් යම් නිලධාරියෙකුගේ මාසික අඩුකිරීම්වල එකතුවේ සීමාව වැටුපෙන් සියයට 40 ට වැඩි නොවිය යුතු වුවත් එම සීමාව පිළිබඳව නොසලකා නිලධාරීන් 03 දෙනෙකුට රු.633,840 ක ආපදා ණය ගෙවා තිබුණි. |
| (ii) 3.17.1 වගන්තිය | ප්‍රධාන ණයකරුගේ පාලනය යටතේ කටයුතු කරන කිසිම නිලධාරියෙකු එකී ණයකරුගේ ඇපකරුවෙකු ලෙස පිළිගත යුතු නොවූවත් ඊට පටහැනිව ප්‍රධාන ණයකරුට ඇපකරුවකු වශයෙන් යටත් නිලධාරියෙකු අත්සන් තබා තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

------------------------------------------

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 110 | අධිකාරියේ ප්‍රධාන විදුලි පරිපථයට හානි සිදුවී තිබුණු නමුත් ඒ පිළිබඳව හානි ලේඛනයේ සටහන් කර නොතිබුණු අතර එය යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු.158,500 ක් වැයකර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 371 සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | • අත්තිකාරම් ලබාදීමේදී අදාළ ගණුදෙනුව සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම මත නිකුත් කළ අත්තිකාරම් මුදලින් සියයට 30 කට වඩා වැඩි ප්‍රමාණයක් ඉතිරිවූ අවස්ථා 39 ක් නිරීක්ෂණය විය. එම වටිනාකම රු.476,945 ක් වූ අතර එය නිකුත් කළ අත්තිකාරම් මුදල් ප්‍රමාණයෙන් සියයට 49 ක් විය.<br><br>• මාස 01 සිට මාස 06 අතර කාලයක ප්‍රමාදයෙන් පසුව අත්තිකාරම් පියවා තිබූ අවස්ථා 18 ක් නිරීක්ෂණය වූ අතර එම වටිනාකම රු.257,230 ක් විය.<br><br>• අත්තිකාරම් අවශ්‍ය වන දිනට සැලකිය යුතු දින ගණනකට පෙර අත්තිකාරම් මුදල් ලබා දී තිබුණ අවස්ථා 13 ක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු.200,580 ක් විය.<br><br>• 2015 වර්ෂයේ අවස්ථා 04 ක දී ලබාදුන් අත්තිකාරම් මුදලින් රු.66,580 ක් ද, 2016 වර්ෂයේ අවස්ථා 18 කදී ලබාදුන් අත්තිකාරම් මුදලින් රු.507,725 ක් ද, 2017 වර්ෂයේ අවස්ථා 442 ක දී ලබාදුන් අත්තිකාරම් මුදලින් රු.5,540,530 ක් ද, 2016 වර්ෂයේ විශේෂ වැඩසටහන් පැවැත්වීම සඳහා අවස්ථා 16 ක දී ලබාදුන් අත්තිකාරම් මුදලින් රු.11,399,000 ක් ද 2017 වර්ෂයේ විශේෂ වැඩසටහන් පැවැත්වීම සඳහා අවස්ථා 62 ක දී ලබාදුන් අත්තිකාරම් මුදලින් රු.101,841,492 ක් ද, වශයෙන් එකතුව රු.119,355,327 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත අනුව අධිකාරියේ පහත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි 2017 වර්ෂයේදීද අවධානය යොමු කර නොතිබුණි.

(i) පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ වෙළඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම.

(ii) තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාළ පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම.

### 3.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තරඟකාරී ව්‍යවසායකයින් සඳහා නව තොරතුරු හා යාවත්කාලීන තොරතුරු ලබාදීම සඳහා සතියකට විනාඩි 30 ක් බැගින් වන රූපවාහිනී වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබුණද 2017 වර්ෂයේ දී වැඩ සටහන් 06 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් 20 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව තාක්ෂණික දැනුම හා නිපුණතාවය ලබාදීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර ඒ සඳහා රු.500,000 ක ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.14,000 ක් වැයකර තිබුණු අතර පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ව්‍යාපාර සංසද පිහිටුවීමට රු.500,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2017 වර්ෂයේදී අළුතින් ව්‍යාපාර සංසද පිහිටුවා නොතිබුණු නමුත් ප්‍රතිපාදනයෙන් රු.69,000 ක් වැයකර තිබුණි.

(ඈ) ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ගේ ගැටළු විසඳීම සඳහා Issue Tracker සංවර්ධනය කිරීමට රු. මිලියනයක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මෙම කටයුතු 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා දිස්ත්‍රික් 03 ක නියමු ව්‍යාපෘතියක් වශයෙන් කරගෙන ගොස් තිබුණු අතර ව්‍යවසායකයින්ගේ නොවිසඳුනු ගැටළු ඇතුළත් කිරීම පමණක් සිදුකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පළාත් මට්ටමින් ගැණුම්කරුවන්ගේ හා විකුණුම්කරුවන්ගේ හමුවීම් 09 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද නුවර සහ ගම්පහ දිස්ත්‍රික් දෙකෙහි හමුවීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

(ඊ) අධිකාරිය සඳහා ISO සහතිකය ලබාගැනීමට අවශ්‍ය වන අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වාදීම හා වැඩිදියුණු කිරීම සඳහා රු.500,000 ක ප්‍රතිපාදන වෙන්කරගෙන ISO 9001 ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශක ආයතනය සමඟ ගිවිසුම් ඇතිකර ගෙන තිබුණි. එහෙත්

අධිකාරියේ කාර්ය මණ්ඩලයෙන් ඒ සඳහා ලැබුණු සහයෝගය හීනවීම නිසා අදාල කාර්යය සිදුකිරීම මන්දගාමීව පැවතුණි.

(උ) විශේෂ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

(i) විශේෂ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ රැකියා අවස්ථා දස ලක්ෂයක් සඳහා අත්වැලක් වීමට කාර්ය මණ්ඩලය සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් සහ ව්‍යවසායකයන් පුහුණු කිරීමේ වැඩසටහන් අදියර I හා II සියළුම දිස්ත්‍රික්කවල පැවැත්වීම සඳහා රු. මිලියන 40 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2017 වර්ෂයේදී එම එකදු වැඩසටහනක්වත් පවත්වා නොතිබුණි.

(ii) මෙම වැඩසටහන යටතේ සියළුම විශ්ව විද්‍යාලවල "උපාධිධාරී ව්‍යවසායක උදානය" පුහුණු වැඩසටහන් පවත්වා තෝරාගනු ලබන උපාධිධාරී ව්‍යවසායකයින් සඳහා මූල්‍යාධාර සැපයීමට රු.මිලියන 10 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද කැළණිය, යාපනය හා ඌව විශ්ව විද්‍යාලවල පමණක් මෙම වැඩසටහන් පවත්වා රු.2,734,500 ක මූල්‍යාධාර ලබාදී තිබුණි.

(iii) විශේෂ ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘති යටතේ දිස්ත්‍රික් 07 ක් සඳහා ප්‍රතිලාභීන් හඳුනාගැනීම, පුහුණු අවශ්‍යතාවයන් තක්සේරුව, යන්ත්‍ර උපකරණ සැපයීම හා පසු විපරම් කිරීම යනාදී කාර්යයන් සැලසුම් කර තිබූ අතර ඒ සඳහා වෙන්කල ප්‍රතිපාදනය රු.105,000,000 ක් විය. 2017 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ රු.102,452,492 ක් වූ අත්තිකාරම්වලින් සියයට 98 ක් මෙම වාර්තාවේ දින වන විටත් පියවා නොතිබුණි.

### 3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 32 දෙනෙකු හා තථ්‍ය සේවක සංඛ්‍යාව 23 දෙනෙකු විය. ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරී තනතුරු 02 ක්, ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර නිලධාරී තනතුරු 06 ක් සහ කළමනාකරණ සහකාර තනතුරු 01 ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාව තුළ කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය සංවර්ධනය උනන්දු කරවීම වැඩිදියුණු කිරීම සහ පහසුකම් සැලසීම මගින් ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම අධිකාරියේ ප්‍රධාන අරමුණු වුවත්, එම අරමුණු ඉටුකිරීම සඳහා ඍජුව බලපානු ලබන ව්‍යවසාය ප්‍රවර්ධන නිලධාරීන් හා ව්‍යවසාය ප්‍රවර්ධන සහකාර නිලධාරීන්ගේ අනුමත තනතුරු 13 න් 08 ක්ම පුරප්පාඩුව පැවතුණි.

(ඇ) අධිකාරියේ රියදුරෙකු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණු අතර 2017 වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.454,742 ක්ද අතිකාල හා සංයුක්ත දීමනා ලෙස රු.111,999 ක් ද වශයෙන් අධිකාරිය විසින් එකතුව රු. 566,741 ක් ගෙවා තිබුණු නමුත් එම වියදම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම | විගණන විමසුම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) අත්තිකාරම් | අත්තිකාරම් පියවීම ප්‍රමාද වීම |
| (ඇ) කාර්යමණ්ඩල පරිපාලනය | පුරප්පාඩු නොපිරවීම |